ක්‍රියාකරන බව දේශපාලකයන් අතර ප්‍රචාරය වීමත් සමඟ කොළඹ ඇමරිකානු තානාපති කාර්යාලයෙන් ප්‍රකාශිකා නැන්සි වැන් හෝන් පවසන්නේ ඇමරිකානු කඳවුරක් ස්ථාපිත කිරීමේ පුවත සාවද්‍ය බවයි. එම පුවත සාවද්‍ය නම් රහසිගතයි යනුවෙන් සටහන්කර ශ්‍රී ලංකා විදේශ කටයුතු බලධාරීන් සහ ඇමරිකානු තානාපති නිලධාරීන් අතර අගෝස්තු 28 දා සාකච්ඡාවක් පවත්වා ඇත්තේ කුමකටද?

මෙයට පෙර 2018 අගෝස්තු මස සහ දෙසැම්බර් මස ත්‍රිකුණාමලය සහ කටුනායක ගුවන් තොටුපළේ සිට ජෝන් සී ස්ටෙන්නිස් නෞකාව වෙතද භාණ්ඩ ප්‍රවාහනය සිදුවී තිබේ.

මේ ගැන ගුවන් හමුදා විශ්වාස කටයුතු ආරංචි මාර්ග පැවසුවේ සී 40 යානාවෙන් ගෙන ආ භාණ්ඩ කිසිවක් ගුවන් හමුදාවේ නිරීක්ෂණයට ලක්නොවූ බවයි.

එසේම ඇමරිකානු නාවික හමුදාව තවදුරටත් ප්‍රකාශ කළේ මෙම භාණ්ඩ ප්‍රවාහනය ඉන්දු ශාන්තිකර කලාපයේ යහපත උදෙසා සිදුවූවක් බවයි. එහෙත් ඇමරිකානු උප ජනාධිපති මයික් සෙන්ස් හම්බන්තොට වරාය චීන නාවික කඳවුර ක් ලෙස භාවිත කරනු ඇතැයි අනතුරු අවද්දී ඉන්දු ශාන්තිකර කලාපයන් කෙරෙහි ඇමරිකානු නාවික හමුදාව දක්වන උනන්දුව තහවුරු වේ.

මේ අතර ලන්ඩන් නුවර කොටි මැර කල්ලියකට මරණීය තර්ජන කරන ලද බවට දක්වමින් වෙස්ට්මිනිස්ටර් අධිකරණය පසුගිය 21 වැනිදා බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දු අත්අඩංගුවට ගන්නා ලෙසට දුන් තීන්දුව පසුගිය සඳුදා අහෝසි කළ විනිසුරු වරිය නඩු විභාගය පෙබරවාරි 1 දාට නියම කරනු ලැබීය.

ඊට හේතුවූයේ බ්‍රිගේඩියර්වරයාට තානාපති මුක්තිය ඇති බවට බ්‍රිතාන්‍ය පොදු රාජ්‍යමණ්ඩල කාර්යාලය අධිකරණය වෙත කරුණු යොමුකිරීමයි. මේ නිසා කොටි ඩයස්පෝරාව වෙනුවෙන් පෙනී සිටි පබ්ලික් ඉන්ටර්රෙස්ට් ලෝ සෙන්ටර් නමැති ආයතනය දැඩි නොසන්සුන්තාවකට පත්වී බ්‍රිගේඩියර්වරයාව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුව අවලංගු කිරීමට පෙර පැමිණිලික රුවන්ගෙන් කරුණු විමසා නැති බවත් තානාපති නිලධාරියකු තම ධුරයෙන් ඉවත්වීමෙන් පසු තානාපති මුක්තිය බලපවත්වන්නේ දින 31 කට පමණක් බවත් කියා සිටියේය.

අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුව ඉවත් කිරීම නිසා බ්‍රිතාන්‍ය අධිකරණය ලැජ්ජාවට පත්විය යුතු බව කියමින් කොටි ඩයස්පෝරාව වෙස්ට්මිනිස්ටර් අධිකරණයට අවමන් කිරීම ද ක්‍රියා කළේය.

එසේම කොටි ඩයස්පෝරාව ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශ ප්‍රකාශිකාව හමුදා මාධ්‍ය ප්‍රකාශක සහ ජනාධිපති නීතිඥ ජයතිස්ස කොස්තාද ජනතාව සහ බ්‍රිතාන්‍ය පොදු රාජ්‍යමණ්ඩල කාර්යාලය නොමඟයවා ඇති බවට චෝදනා කළහ.

මෙහිදී ශ්‍රී ලංකා බලධාරීන් පැවසුවේ බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දුට එරෙහිව සිතාසි නිකුත් කර නැති බවත් නඩු විභාගය පවත්වන ලද්දේ ඔහුගේ සහභාගිත්වයෙන් තොර බවයි.

මේ නිසා පොදු රාජ්‍යමණ්ඩල කාර්යාලය ශ්‍රී ලංකාවේ කරුණු දැක්වීම වෙස්ට්මිනිස්ටර් අධිකරණයේ විනිසුරු සෝනියා හෙන්ස්ලේ වෙත ඉදිරිපත් කර ඇත.

මින් කොටි ඩයස්පෝරා ක්‍රියාකාරීන් සහ ඔවුන්ගේ නීතිවේදීන් කෝපයට පත්වී තිබේ.

එහි ප්‍රතිඵලයක් වූයේ පොදු රාජ්‍යමණ්ඩල කාර්යාලය මෙම ගැටමුට මැදිහත්වූයේ කෙසේදැයි අනාවරණය කරන ලෙස කොටි ඩයස්පෝරාව එම කාර්යාලයෙන් ඉල්ලා සිටී.

මේ හැර බ්‍රිගේඩියර්වරයා අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුව ඉවත් කිරීමට එරෙහිව ප්‍රතිවිරෝධතා දක්වන බවද පැමිණිලිකරු වන් මෙහෙයවූ රටින් පිටත ඊළම් ආණ්ඩුව නමැති හොර සංවිධානය ප්‍රකාශ කර ඇත.

බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දු මරණීය තර්ජන එල්ල කරන ලද බව කියමින් රටින් පිටත ඊළම් ආණ්ඩුව සංවිධානයේ නීති උපදේශක ගීත් කුලසේකරම් වෙනුවෙන් පබ්ලික් ඉන්ටර්රෙස්ට් ලෝ සෙන්ටර් ආයතනයේ පෝල් හෙරන් සහ හෙලන් මෝවට් නීතිවේදීන් ඉදිරිපත් විය.

එහෙත් මේ නඩුව පසුබිමේ ක්‍රියාත්මක වූයේ ඊළම්වාදියකුවූ මහාචාර්ය මුතුකුමාරස්වාමි සෝර්නරාජායි. ශ්‍රී ලංකා රජය මොහුට මෙරටට පැමිණ යාපනයට ගොස් සම්මන්ත්‍රණයක් පැවැත්වීමටද ඉඩදී තිබුණි.

මේ අතර නැගෙනහිර කොටි හමුදා නායකයන්ව සිටි විනයගමූර්ති කරුණා වසර 29 කට පසු වසන් වී තිබූ රහසක් විශේෂ කාර්ය බළකායේ හිටපු නිලධාරියකු වූ ජනෙත් විමල සහ ජාත්‍යන්තර අපරාධ නීතිය ගැන දන්නා නීතිවේදී ටෙනී ප්‍රනාන්දු හමුවේ හෙළිකළේය. ඒ කොටි සංවිධානය විසින් ම්ලේච්ඡ ලෙස ඝාතනය කළපොලිස් භටයන් 600 කගේ සිද්ධියයි.

''ආර් ප්‍රේමදාස සමයේ සාම සාකච්ඡා බිඳ වැටීමත් සමගම ප්‍රභාකරන් සියලූම කොටි හමුදා නායකයන් වන්නියට කැඳවූවා. ඔහු පැවසුවේ කොටි ක්‍රියාකාරීන් රැසක් රජය අත්අඩංගුවට ගෙන ඇති නිසා නැගෙනහිර පොලිස් භටයන් ප්‍රාණඇපකරුවන් ලෙස අල්ලාගෙන අපේ අය නිදහස් කරන තුරු පොලිස් භටයන් නිදහස් නොකළ යුතු බවයි.

පොලිස් භටයන් අල්ලා ගැනීමේ මෙහෙයුම ඔහු කොටි බුද්ධි නායක පොට්ටු අම්මාන් සහ විශේෂ හමුදා නායක නිව්ටන්ට පැවැරු වා. මේ මෙහෙයුමට තවත් කොටි හමුදා නායකයන්වූ නගුලන්, රාම්, ඬේවිඩ් රිගන් ඇතුළු පිරිසක් සම්බන්ධ වුණා. අත්අඩංගු වට ගත් පොලිස් භටයන් වන්නියට ගෙනඑන ලෙස ප්‍රභාකරන් විසින් පොට්ටු අම්මාන්ට නියෝග කළා. මේ පොලිස් භටයන්ව වන්නියට ගෙන ඒමට උත්සාහ කරන අවස්ථාවේ හමුදාවෙන් ප්‍රහාර එල්ල වුණා. එහිදී ප්‍රතිප්‍රහාරවලින් හමුදාවේ අටක් සහ කොටි 10 ක් මියගියා.

මේ බව ප්‍රභාකරන්ට වාර්තා වුණා. ඔහු පොට්ටුඅම්මාන්ට නියෝග කරමින් පොලිස් භටයන් සියලූදෙනා ඝාතනය කරන ලෙස කියා සිටියා යැයි විනයගමූර්ති කරුණා කියා සිටියේය.

පසුගිය ඉරිදා දහවල් මඩකලපුවේදී කරුණා හමුවී පොලිස් භටයන් 600 ක් ඝාතනය කිරීමේ සිද්ධිය ගැන ජනෙත් විමල සහ නීතිවේදී ටෙනී ප්‍රනාන්දු කළ සාකච්ඡාවේදී මේ තොරතුරු හෙළිවිය.

''මේ මහා සමූල ඝාතනය ගැන මං දිවුරා සාක්කිදීමට සූදානම්. අවශ්‍යනම් ජිනීවා මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ සාක්ෂි දෙන්න මා ලෑස්තියි. මෙය යුද අපරාධයක් යැයි කරුණා සඳහන් කළේය.

මෙම සමූල ඝාතනය සිදුවූයේ 1990 ජුනි 11 දායි. කරුණා මේ අබිරහස් හෙළිකළේ කොටි ඩයස්පෝරා ක්‍රියාකාරියකුව පෝල් නිව්මන් ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ පැවැති සමාන්තර රැස්වීමකදී පොලිස් භටයන් 600 ඝාතනය කළේ කරුණා බවට චෝදනා නැඟීමයි. පොලිස් භටයන් 600 සමූල ඝාතනයට සම්බන්ධ නැගෙනහිර කොටි හමුදා නායකයකුවූ ඬේවිඩ් පොතුවිල් පොලිසියේ රථවාහන ස්ථානාධිපතිගේ යතුරු පැදිය පැහැරගෙන එන අවස්ථාවේ විශේෂ කාර්ය බළකායේ ප්‍රහාරයකින් මරුමු වට පත්විය.

මේ අතර මාලි රාජ්‍යයේදී ශ්‍රී ලංකා සාම සාධක බළකායේ යුද හමුදා සන්නද්ධ රථයක් මොස්ටි ප්‍රාන්තයේදී බිම් බෝම්බ යකට ගොදුරුවීමෙන් ශ්‍රී ලාංකික සෙබළුන් දෙදෙනෙක් ජීවිතක්ෂයට පත්වූහ.

මෙරට හමුදා භටයන් මාලි රාජ්‍යට යැවීමට පෙර එම රටේ පවතින බිහිසුණු තත්ත්වය හමුදා බලධාරීන් නිරීක්ෂණය කළ යුතුව තිබුණි. 2017 වසරේදී මාලි සාම සාධක බළකායන්ට එරෙහිව ත්‍රස්ත ප්‍රහාර 124 ක් එල්ල විය. 2018 දී එල්ලවූ ත්‍රස්ත ප්‍රහාර සංඛ්‍යාව 192 කි.

එහෙත් දිවි පරදුවට තබමින් ශ්‍රී ලංකා යුද හමුදා භටයන් එක්සත් ජාතීන්ගේ සාම සාධක බළකායට එක්වූහ.

මෙම ශ්‍රී ලංකා භටයන් මාලි රාජ්‍යට යෑමට පෙර ඔවුන්ට එම රටට යැවීමෙන් වළකින ලෙස එක්සත් ජාතීන්ගේ හිටපු නිලධාරිනි යස්මින් සූකා එක්සත් ජාතීන්ගේ මහ ලේකම්ගෙන් ඉල්ලා සිටියාය.

කොටි ඩයස්පෝරාවද ඇගේ ඉල්ලීමට සහාය දක්වමින් මාලි වෙත යන හමුදා භට පිරිස් යුද අපරාධකරුවන් බවට චෝදනා කළහ.

මෙවන් අසත්‍ය තත්ත්වයක් මැද වැඩි වැටුප ක් උදෙසා මෙරට හමුදා භට පිරිස අරාජික තත්ත්වයක පවතින මාලි වෙත ගියහ.

මාලි රාජයේ ටිම්බක්වූ සහ ගාඩි නගර වලින් අල්කයිදා ත්‍රස්තයන් පලවා හැරියත් රටේ වැඩි කොටසක් රජයේ පාලනයෙන් තොරව පවතී.

මේ වසරේ ජනවාරි 20 දා මාලි රාජයේ පිහිටි එක්සත් ජාතීන්ගේ සාම සාධක බළකා කඳවුරකට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් චැඩ් රාජයේ සාම සාධක භටයන් 10 ක් මියගොස් 25 ක් තුවාල ලැබූහ.

මේවන විට ලත්තොරතුරු වලින් හෙළිවී ඇත්තේ ශ්‍රී ලංකා භටයන් ගමන් කළ සන්නද්ධ රියට බිම් බෝම්බයක් අටවා ඇත්තේ අල්කයිදා ත්‍රස්තයන් බවයි.

මෙහිදී නැඟෙන බරපතළ ප්‍රශ්නය නම් ශ්‍රී ලංකා හමුදාව මාලි රාජ්‍යට බිම්බෝම්බ නාශක බපල් රථ ගෙනයෑමට ක්‍රියානොකළේ මන්ද යන්නයි.

එසේම එක්සත් ජාතීන්ගේ සාම සාධක බළකායන් සේවය කරන රටවල් අතුරින් බරපතළ අනතුරුදායක රට මාලි රාජ්‍ය බව එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති සේවය හෙළිකර තිබුණි.

2013 වසරේ සිට මේ දක්වා මාලි රාජයේ සාම සාධක භටයන් 100 කට අධික පිරිසක් මරුමුවට පත්වී ඇත.

එවන් තත්ත්වයක් මත අපේ හමුදාව එවන් අනතුරුදායක රටක සාම සාධක බළකා මෙහෙයුමකට මෙරට හමුදා භටයන් යැව්වේ මන්ද?

මාලි රාජයේ බොන්ඩි ප්‍රාන්තයේ සාහසික ක්‍රියා විශාල ලෙස සිදුවී ඇති අතර සිවිල් වැසියන් පවා ඝාතනයට ලක්වී තිබේ. වරක් සිවිල් වැසියන් 37 ක් ඝාතනය වී තිබේ. මේ නිසා මෙම අනතුරුදායක තත්ත්වය ගැන මෙරට බලධාරීන් වෙතින් විමර්ශනයක් සිදුවී තිබේ.

මේ පසුබිම මැද වත්මන් ආරක්ෂක ලේකම් වරයා යුද අපරාධ ගැන කොටි ඩයස්පෝරාවෙන් තොරතුරු ඉල්ලා සිටීම ගැන විමර්ශනයක් කරන්නැයි ගෝලීය ශ්‍රී ලංකා සංසදයේ සම්බන්ධිකාරක රංජිත් සොයිසා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත හදිසි සංදේශයක් යවමින් ඉල්ලා ඇත.

2007 සිට 2009 දක්වාවූ කාලය තුළ පැවැති වන්නි මෙහෙයුමට කිසිසේත් දායක නොවූ වත්මන් ආරක්ෂක ලේකම් පදක්කම් හිමි අය පමණක් රණවිරුවන් කර ඇති ප්‍රකාශය ගැන ආබාධිත සෙබළු දැඩිලෙස විරෝධය පා ඇත.

අපේ සෙබළු රැසක් දිවි පිදුවා. ඔවුන්ට පදක්කම් හිමිවූයේ නැහැ. එසේ නම් මියගිය සෙබළු රණවිරුවන් නොවේද යැයි හිටපු හමුදා නිලධාරියෙක් පැවැසීය.

වත්මන් ආරක්ෂක ලේකම් යුද අපරාධ සිදුකළ හමුදා නිලධාරීන් ගැන සාක්කි දෙන ලෙස ඩයස්පෝරාවෙන් කළ ඉල්ලීමද දේශප්‍රේමී විදෙස්ගත ජනතාවගෙන් දැඩි විරෝධයට ලක්විය. මොහුගේ මේ ප්‍රකාශය ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාටද වාර්තා විය.

මේ පසුබිම මැද වැල්වැටිතුරේ ප්‍රදේශයේදී කොටි යුද ටැංකිය සහ මුහුදු කොටි බෝට්ටුවල අනුරූ දක්වන සරුංගල් ප්‍රදර්ශනයක්ද පවත්වා ඇත. උතුරේ 12000 ක් කොටි සිටින බවත් ඔවුන් යම් දිනෙක අවි අතට ගනු ඇතැයි අපි ගතවූ කාලය මුල්ලේම පෙන්නුම් කළෙමු. අද ක්‍රම ක්‍රමයෙ න් කොටි පුල්ලි උතුරෙන් මතුවී ඇත.

මේ අතර වසර 29 කට පෙර පොලිස් භටයන් 600 ක් ඝාතනය වීම ගැන ජනාධිපති කොමිසමක් පත්කරන ලෙස විශේෂ කාර්ය බළකායේ නිලධාරියකුවූ ජනෙත් විමල ජනාධිපතිවරයාගෙන් ඉල්ලා ඇත. මේ පසුබිම මැද මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාට එරෙහිව කොටි ඩයස්පෝරාවට සම්බන්ධ යස්මින් සූකා පිටු 139 ක වාර්තාවක් ජිනීවා මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත්කර ඇත. මේ හිටපු එක්සත් ජාතීන්ගේ නිලධාරිනිය මේජර් ජෙනරාල්වරයා සමග මුල සිටම ක්‍රෝධයෙන් පසුවේ. මේ සාවද්‍ය වාර්තාවට ඡායාරූප සපයා ඇත්තේ රජයේ මාධ්‍ය ආයතනයක ඡායාරූප ශිල්පියකු බව හෙළිවී ඇත.

මේජර් ජෙනරල්වරයාට එරෙහිව ඉදිරිපත් වූ මේ වාර්තාවෙන් යස්මින් සූකා ඉල්ලා ඇත්තේ ශ්‍රී ලංකා රජය ඔහුගේ වැඩ තහනම්කර නීතිපති එලවා පරීක්ෂණයක් කරන ලෙසත් ජාත්‍යන්තර ප්‍රජාව ඔහුව අත්අඩංගුවට ගන්නා ලෙසත්ය. එසේම එක්සත්ජාතීන්ගේ සාම සාධක බලකා කටයුතු වලින් ශ්‍රී ලංකාවේ හමුදාව වහාම ඉවත්කළ යුතු බවද ඇය තවදුරටත් දක්වා තිබිණි.

යස්මින් සූකා මේජර් ජෙනරල්වරයාට එරෙහිව ක්‍රියාත්මක කර ඇත්තේ කොටි ඩයස්පෝරාවේ මෙහෙයුමකි. ඒ සඳහා ඇයට අතිවිශාල මුදලක් ලැබී තිබේ.